# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1789/38 – 2012 දෙසැම්බර් 20 වැනි බ්‍රහස්පතින්දා – 2012.12.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේපත්තුව සුළු කොට්ඨාසයේ, පලිගෙදර ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක සීඕ/කේඑස්බී/2011/974 හා 2012 ජනවාරි මස 27 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.4815ක් පමණ වූ ඉඩම් කොටසට මායිම්:

**කැබලි අක්ෂර 'ඒ' – දෙල්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.4815**

උතුරට: මීමනගේ රෝහිණී හේමලතා හිමිකම් කියන දෙල්ගහවත්ත සහ පාර; නැගෙනහිරට සහ දකුණට: පාර; බටහිරට: ඒ. ඩී. ඩොනල්ඩ් සහ කේ. ඩී. අයෝනි චන්ද්‍රලතා හිමිකම් කියන දෙල්ගහවත්ත.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/10/2010/යූඩීඒ/314.
2012 ඔක්තෝබර් මස 09 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01 - 170

සැ.යු.– මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත හැකිය.